මැයි 02, 2023 දින ප්‍රංශයේ සිට පැමිණි ගුවන් මගියෙකුගේ ගමන් බෑගය තුළින් රිවෝල්වරයක් සහ පිස්තෝලයක් සොයා ගැනීම, ඒවා ප්ලාස්ටික් බව සොයා ගැනීම සහ අදාළ සැකකරු කටුනායක ගුවන්තොටුපළ පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම, මාධ්‍ය තුළ අවධානය දිනා ගෙන තිබිණි.
කෙසේ වෙතත්, මෙම සිදුවීම වාර්තා කරනා දිනමිණ සහ දිවයින පුවත්පත් සඳහන් කර ඇත්තේ, ඔහු කොළඹ 15 ප්‍රදේශයේ පදිංචි "ද්‍රවිඩ ජාතික" මගියෙකු බවයි.
මෙම පුවත උපුටා දක්වන දෙරණ අරුණ නිවේදකයා විසින් ද සඳහන් කරන්නේ, එම පුවත තුළ ජාතිකත්වය ඉස්මතු කොට ඇති බවයි. දෙරණ අරුණ වැඩසටහන එසේ එම පුවත තුළ ජාතිකත්වය ඉස්මතු කොට ඇති බව හඳුනා ගැනීම ද වැදගත් කරුණකි.
මන්ද යත්, මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් මාධ්‍යවේදීන්ට උපදෙස් දෙන්නේ, පුවතකට අවශ්‍ය නොවන වාර්ගිකත්වයක් ඉස්මතු කොට දක්වමින් පුවත් වාර්තා නොකරන ලෙසින් වන බැවිනි.
ඒ අනුව,
1) මෙම පුවත සඳහා සිදුවීමට අදාළව අත්අඩංගුවට ගැනුණු ගුවන් මගියාගේ වාර්ගිකත්වය "ද්‍රවිඩ" යනුවෙන් දැක්වීම පුවතට අදාළ යැයි ඔබ සිතන්නේ ද?
2) එසේ අදාළ නොවන වාර්ගිකත්වයන් ඉස්මතු කොට දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයට අයත් අය සෘණාත්මකව ඒකාකෘතික (negatively stereotype) වීමේ ඉඩක් නොමැති ද?
(මෙම පුවත එදින දමිළ භාෂා පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

